**ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 නොවැම්බර් 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝම්බර් 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල රු.214,180,540 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයට රු.32,791,686 ක් වූ එකතු කළ අගයමත බදු ඇතුළත් කර තිබුණු අතර ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.32,791,686 කින් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අපගේ ගිණුම් ක්‍රමය වෙනස් කර ගැනීමට කටයුතු කරන බවත් 2016.08.03 දිනැති අංක 2016/250(i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් මත ඉහත ක්‍රමවේදය අනුගමනය කළ බවද දන්වමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව කුලී හා වැඩ අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 09 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම වත්කම් අදාළ වත්කම් ලේඛනයන්හි ගිණුම් ගත කිරීමට ක්‍රියාකල යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමණාකාරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කළ අග්‍රිම රු. මිලියන 4,890.9 ක් වූ අතර භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අග්‍රිම රු.මිලියන 1,314.8 ක් විය. ක්‍රියාකාරි සැලැසුම්වල කාර්යයන් නියමිත කාල වකවානුවල ඉටු නොකිරීම එම කාර්යයන් වර්ෂය අවසානයේ සිදු කිරීමට කටයුතු කිරීම හා ප්‍රමාණවත් පරිදි අවශ්‍යා අග්‍රිම භණ්ඩාගාරය විසින් ලබා නොදීම හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් නිසි ලෙස ඉටුකළ නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අවස්ථා ගණනාවකදී භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබාදීම හේතු කරගෙන සමස්ථයක් ලෙස වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සහ ඒ අනුව සිදුකළ යුතු ක්‍රියාකාරකම් නිසි පරිදි සැලසුම් කිරීමේ අපහසුතා ඇති වේ. නිසි පරිදි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගෙන අදාළ කාර්යයන් නිම කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| <u>වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.</u><br>කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු මූලධන ශුද්ධ ප්‍රතිපාදනය රු.999,046,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.792,201,162 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.206,844,832 ක් හෙවත් සියයට 20.7 ක් ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | පිළිගන්නා ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණු ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු වේ. එසේ වුවද බැරකම් ලෙස දක්වා නොතිබුණු අංක 219-2-2-2-1409 දරන (අන්තර් ජාතික ක්‍රීඩා) වැය විෂයයේ රු.මිලියන 36.61 ප්‍රතිපාදන ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී රු.37,877,351 ක වියදම් දරා තිබුණි. | දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.මිලියන 344 න් භාණ්ඩාගාරයෙන් රු.මිලියන 250 ක් පමණක් ලද අතර, ජාතික ඔලිම්පික් කමිටුව වෙත භාණ්ඩාගාරයෙන් වෙන්කර තිබුණු රු.මිලියන 100 ක් නොලැබීම හා ජාත්‍යන්තර තරඟාවලියක් වන බැවින් ක්‍රීඩා කණ්ඩායම් සහභාගි කරවීමට සිදු වී තිබුණි. | බැඳීම් වලට එළඹීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණයන් වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ චක්‍රලේඛය (අ) 2.3 ඡේදය | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/ සේවාලාභීන් ප්‍රඥප්තිය පිළියෙල කිරීම, ක්‍රියාවට නැංවීම, එම කටයුතු අධීක්ෂණය සහ ඇගයීම් සඳහා ක්‍රමවේදයක් සැකසීම යනාදී කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය මේ වන විට පිළියෙල කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 6.5 ඡේදය | සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කලයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී ක්‍රියා කිරීමට සටහන් කර ගන්නා ලදී. | -එම- |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරියකුගේ වර්ෂ 15 කට වඩා පැරණි රු.58,450 ක ණය ශේෂයට අදාළ, ණය ගොණුව ලේඛණාගාරයේ නොතිබීම හා සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ නොවීම හේතුවෙන් එම ණය මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට ද නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය. | ණය මුදල ගෙවන ලෙස උරුමකරුවන් වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. | අයවිය යුතු ණය ශේෂයන් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 570 අනුව ඉඩම් ඉල්ලීම් සඳහා තැන්පතු හැර ව්‍යාපෘති අරමුදල් තැන්පතු ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වර්ෂ 02 ක් හා අනිකුත් සියලුම තැන්පතු තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක කාල පරිච්ඡේදය තුළ හිමිකම් නොපැවොත් ඒවා ඉකුත් වූ තැන්පතු ලෙස සලකනු ලබන අතර මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු විය. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ පැවති රු. 17,741,534 ක් වූ තැන්පතු 51 ක් සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 01 දින වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉකුත් තැන්පතු පිළිබඳ ඉදිරියේදී කටයුතු කරමි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යයන් ඉටු නොකිරීම

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ නව ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත කර තිබුණු අතර, පෙර වර්ෂයේ නිම නොකළ ව්‍යාපෘති 28 ක් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණි. පෙර වර්ෂ වලට අදාළ ව්‍යාපෘති 16 ක් හා 2020 වර්ෂයේ ව්‍යාපෘති 12 ක වැඩ සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබුණි. තවද 2020 වර්ෂයේ ව්‍යාපෘති 06 ක් නිම නොකර අත්හැර දමා තිබුණු අතර ව්‍යාපෘති 16 ක වැඩ නිම කල යුතුව පැවතුණි. | 2021 වර්ෂයේ නව ව්‍යාපෘති 21 න් ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් අවසන් කර ඇති බවත්, ව්‍යාපෘති 06 ක ඉදිකිරීම් ප්‍රදානය කිරීමේදී ගැටළු සහගත තත්ත්වන් හේතුවෙන් ප්‍රදානය නොකළ බව අවිච්ඡේද ව්‍යාපෘති 27 න් ව්‍යාපෘති 04 ක වැඩ නිම කර ඇති බවත් එක් ව්‍යාපෘතියක වැඩ තාවකාලිකව නවතා දමා ඇති බවත් හා ව්‍යාපෘති 04 ක වැඩ නිම කිරීමට ඇති බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) හොකී පිටියේ ධාරා අලෝක පද්ධතිය නිර්මාණය කිරීම** | | |
| ප්‍රේක්ෂකයන්ට වඩා හොඳින් දැක ගත හැකි වන පරිදි හා රූපවාහිනියටද අදාළ කර ගත හැකි වන පරිදි ක්‍රීඩා පිටියේ ආලෝක ධාරා පද්ධතියේ අවශ්‍යතාවය පිරිවිතරවල දක්වා තිබුණද ස්ථිර වශයෙන් කණුවක උස සඳහන් කර නොතිබුණි. නමුත් ජාත්‍යන්තර හොකී සම්මේලනයේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුව කණුවක උස මීටර් 20 ක් විය යුතු වුවද ස්ථාපිත කළ කණුවක උස මීටර් 16 ක් විය. ඒ අනුව අවශ්‍යතාවය ස්ථිරව නොදැක්වීම හේතුවෙන් ඉදිරියේදී පළමු පන්තියේ කෘතිම හොකී ක්‍රීඩා පිටියක් බවට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ අනුව ක්‍රීඩාපිටිය සඳහා රාත්‍රි කාලයේදී නියමිත ආලෝක ධාරාවක් නොලැබීම හේතුවෙන් ක්‍රීඩා පිටිය රාත්‍රි කාලයේදී භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි. | මෙහිදී ක්‍රීඩාපිටියේ සංවර්ධනය කර ඇත්තේ විදුලි ආලෝක පද්ධතියක් සකස් කිරීමකි. ඒ අනුව මෙම ක්‍රීඩාපිටියේ පවතින තරඟ සලකා දෙවන පන්තියේ විදුලි ආලෝක පද්ධතියක් සකස් කිරීම සිදු කර ඇත .<br><br>ඒ අනුව අදාල විදුලි ආලෝක පද්ධතියේ දුර හා විදුලි ආලෝක පද්ධතියේ ආනතිය අනුව නිර්මාණය (Design) කර ඇත. ක්‍රීඩාපිටියේ කණු සිටවන දුර අනුව කණුවේ උස තීරණය | අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි ආකාරයට සහ කාර්ය සාධනය උපරිමයට ලබා ගත හැකිවන පරිදි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කරනු ලබන අතර මෙහිදී ජාත්‍යන්තර හොකී සම්මේලන තීරණය අනුව කණුවේ උස විදුලි ආලෝකය ලැබෙන පිළිවෙල සලකා මීටර් 16 ක උසකට ස්ථාපිත කර ඇත. එමෙන්ම මෙහි ජාත්‍යන්තර මට්ටමේ දෙවන පන්තියේ විදුලි ආලෝක පද්ධතියක් ඉදිකර ඇත. මේ වන විට ජාත්‍යන්තර මට්ටමේ තරඟ කිහිපයක් පවත්වා ඇති බවද කාරුණිකව දන්වමි. | |
| **(ආ)** | **ගලේවෙල දිස්ත්‍රික් මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම** | | |
| **(i)** | මෙම ක්‍රීඩාංගනයේ සංවර්ධනය කිරීමේ කටයුතු රු.11,008,947 (බදු රහිත) අගයකට ඉඩම් හා ගොඩ කිරීම් හා සංවර්ධනය කිරීමේ සමාගම වෙත 2014 වර්ෂයේ ප්‍රදානය කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.2,464,884 ක් ගෙවා තිබුණි. එම ආයතනය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර අත්තිකාරම් මුදල් මාස 18-23 අතර කාලයක් අත රඳවාගෙන නැවත පියවීමට කටයුතු කර තිබුණි. | ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් සිදු කරනු ලැබූ ව්‍යාපෘතියක් වන අතර මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සංවර්ධන ව්‍යාපෘතියේ බිල්පත් මගින් මෙම මුදල් පියවීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කලමනාකරණය සහ නියාමනය සිදු කළ යුතුය. |
| **(ii)** | ඉංජිනේරුමය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය **(CECB)** මගින් ව්‍යාපෘති සඳහා රු.16,039,750 ක් වූ ඇස්තමේන්තුවක් පිළියෙල කර 2016 වර්ෂයේදී තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරනු වෙනුවට වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර රු.14,831,000 අගයකට පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.2,966,200 ක් 2016 වර්ෂයේදී ගෙවා තිබුණි. | පිළිගනිමි. | රාජ්‍ය මුදල් කාර්යක්ෂමව කළමනාකරණයට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| **(iii)** ක්‍රීඩා පිටිය යාබද වැව ජලයෙන් පිරෙන විට ක්‍රීඩා පිටිය යට වීම, පස් පිරවීම් සිදුකළ යුතු මට්ටම උස් කිරීම, වැවේ ජල කානුවේ දිග මීටර් 272 සිට 470 ක් දක්වා වැඩි කිරීම, ප්‍රමාණ පත්‍රයේ තණකොළ වැවිය යුතු ක්ෂේත්‍රය ඝන මීටර් 6500 ක් ලෙස දක්වා ඇතත් එය වර්ග මීටර් 14,500 ලෙස සංශෝධනය වීම සහ පවතින ගොඩනැගිල්ල ප්‍රමාණ පත්‍රවල දක්වා නොමැති වීම යන කරුණු කොන්ත්‍රාත්කරු විසින් ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ ගැටළු ලෙස දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී තිබුණි. | පිළිගනිමි. | ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව සැලසුම් කළ යුතු වන අතර ඉදිකිරීම් කටයුතු කලමනාකරණය සහ නියාමනය සිදු කළ යුතුය. |
| **(iv)** ක්‍රීඩා පිටියේ මීටර් 400 ක් වූ යෝජිත ධාවන පථය ග්‍රාමීය මාර්ගයක් හරහා පිහිටීම හේතුවෙන් නියමිත ප්‍රමිතියකට අනුව ධාවන පථය සකස් නොකර මීටර් 200 දක්වා අඩුකර තිබුණු අතර, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේදී සමාජ හා පාරිසරික බලපෑම් පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබුණි. විධිමත් පරිදි ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හේතුවෙන් සියයට 58 ක වැඩ විෂයයන් ඉවත් කර රු.9,290,000 ක් වූ අගයක් සඳහා ක්‍රීඩාංගනයේ වැඩ **(Ground work)** පමණක් එකතු කර කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. | මෙය ග්‍රාමීය ක්‍රීඩාපිටියක් ලෙස සලකා මීටර් 200 ධාවන පථයක් ලෙස ලැබෙන ප්‍රතිපාදන මත සකස් කිරීමට යෝජනා වීම හා වැවේ වාන ඉස්සීම හේතුවෙන් මෙසේ සිදුවී ඇත. | -එම- |
| **(v)** ජලය නියමිත පරිදි බැස යාම සිදු නොවීම හේතුවෙන් ක්‍රීඩාංගනයේ බොහෝ ස්ථානවල වැසි ජලය පිරී පැවතීම සහ ක්‍රීඩා භූමියේ මතුපිට පෘෂ්ඨය බොරලු යොදා සකස් කිරීමෙන් ප්‍රාදේශයේ දරු දැරියන්ට ක්‍රීඩා පුහුණු කටයුතු සිදු කිරීමට අපහසුතා පැවතීම හේතුවෙන් මෙම ක්‍රීඩා පිටිය සඳහා වැය කළ පිරිවැයට අපේක්ෂිත කාර්ය සාධනයක් ලබා කර ගත නොහැකි ව්‍යාපෘතියක් ලෙස නිරීක්ෂණය විය. | මේ සඳහා 2022 වර්ෂයේ ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | අපේක්ෂිත කාර්ය සාධනය ලබාගත හැකිවන පරිදි ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව සැලසුම් කළ යුතු වන අතර ඉදිකිරීම් කටයුතු කලමනාකරණය සහ නියාමනය සිදු කළ යුතුය. |
| (ඇ) **උතුරු පළාත් ක්‍රීඩා සංකීර්ණය කිලිනොච්චිය පිහිනුම් තටාකය මෙහෙයුම් කටයුතු** | | |
| කිලිනොච්චියේ පළාත් මට්ටමේ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම් පිරිවැය රු.375,060,183 ක් වූ අතර එය ඉදිකර 2019 මාර්තු 17 දින විවෘත කර තිබුණි. | මේ වන විට සියළු අඩුපාඩු සකස් කර පිහිනුම් තටාකය නඩත්තු කටයුතු සිදු කරමින් | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන ලෙස |

| | | |
|---|---|---|
| පිහිනුම් තටාකයේ ජල පෙරහන තුනක් සවි කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී පෙරනයක් අක්‍රිය වී තිබීම හේතුවෙන් නල පද්ධති කැඩී ගොස් ප්‍රමාණවත් පරිදි ජලය පෙරා ගැනීමට නොහැකි වී තිබුණි. පිහිනුම් තටාකයේ වැකුම් පද්ධතිය ක්‍රියා නොකිරීම හේතුවෙන් සහ වැකුම් පද්ධතිය හා සම්බන්ධ නළයේ කාන්දු වීම හේතුවෙන් පිහිනුම් තටාකයේ රික්ත පද්ධතිය හරහා වැලි, පිහිනුම් තටාකයට ඇතුළු වන බව නිරීක්ෂණය විය. 2020 දෙසැම්බර් වන විටද උතුරු පැත්ත මණ්ඩපය සහ දකුණු පැත්තේ පිවිසුම් දොරටුව ඉදිකර නොතිබූ හෙයින් සුළං සමයේදී පිහිනුම් තටාකය අසල දූවිලි සහිත විය. ජල මෝටරය සඳහා විදුලිය ලබාදීමේදී නියමිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් සිදුකර නොතිබුණි. පිහිනුම් තටාකය පරිශ්‍රයේ සාප්පු 05 ක ඉදිකිරීම් අවසන් කර වසර දෙකක් ගතවී තිබුණද එම කඩ කුලීයට දීමට කටයුතු කර නොතිබුණි. කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණය පරිශ්‍රයේ කොන්ත්‍රාත් සේවකයින් 06 දෙනෙකු සහ භූමි සහයකයින් 04 ක් සිටියද පිහිනුම් තටාකය අවට පරිසරය නිසි පරිදි පිරිසිදු කර නඩත්තු කර නොතිබුණි. | පවතී. තවද දක්වා ඇති පිවිසුම් දොරටුව ඉදිකිරීම ඉදිරි ප්‍රතිපාදන මත සිදු කල හැකි බව දන්වා සිටිමි.<br><br>කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණය පරිශ්‍රයේ පිහිනුම් තටාකයේ සාප්පු 05 ඉදිරියේදී පෞද්ගලික ආයෝජකයින් සඳහා ලබාදීමට දැනට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. | ව්‍යාපෘති ඉදිකිරීමෙන් පසු නඩත්තු කටයුතු සිදු කළ යුතු වීම. |

## 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණු ව්‍යාපෘති 25 ක ඉටුකිරීමේ ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය. | භාර ගැනීම ප්‍රමාද වීම, වැඩ නිම නොවීම, විදුලි සැපයුම ලබා ගත යුතුව තිබීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම, පුරාවිද්‍යා වටිනාකමින් යුතු භූමියක් වූ බැවින් ඉදිකිරීම් තාවකාලිකව නතර කර පසුව අවසර ලබාදීම, උපදේශන ආයතනය හා කොන්ත්‍රාත් ආයතනය අතර ගැටළු සහගත තත්වයක් ඇති වීම හා ව්‍යාපෘති ඉදිකිරීම සඳහා භාරදී තිබූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ගැටළු, ව්‍යාපෘතින්හි වැඩ ප්‍රමාද වීමට හේතු විය. | ඉදිකිරීම් සඳහා නියමිත කාලරාමුව නිවැරදිව සැලසුම් කළ යුතු වීම හා සැලසුම් කල කාර්යභාරයන් නිමකර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය හා නියාමනය කළ යුතු වීම. |

## 3.4 වත්කම් කළමනාකරණය - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වාර්තා

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අතිරික්ත භාණ්ඩ අයිතම 190 ක ඒකක 4509 ක් පැවති එය මු.රෙ. 751 ප්‍රකාරව බඩු ලේඛන පොතෙහි හෝ 763 වැනි මුදල් රෙගුලාසි අනුව සකස් වුණු ගබඩා පොත්වල ලැබීම් ලෙස ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 751 හා 763 අනුව කටයුතු කරන ලෙස සියළුම අංශ ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දී ඇත | වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම සහ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ අයිතම 48 ක් සඳහා ඒකක 411 ක පැවති ඌණතා සම්බන්ධයෙන් මු.රෙ. 103 (1) අනුව ක්‍රියාමාර්ග ගැනීමට සහ පැවති ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමෙන් පසු මු.රෙ.760 ප්‍රකාරව විධිමත් අධීක්ෂණයකින් යුක්තව බඩු ලේඛන පොත්, තොග පොත් ආදියෙන් එම භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | අදාළ ඌනතා සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | වත්කම් පාලනය හා වත්කම් කළමනාකරණය නියමිත අභ්‍යන්තර පාලනයකින් යුතුව ක්‍රියාත්මක කළ යුතු වීම |
| (ඇ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රීඩ් ඇවනියුව් හොකී ක්‍රීඩා පිටියේ ධාරා ආලෝක පද්ධතිය නිර්මාණය කිරිම, සැපයිම, ස්ථාපනය කිරිම හා පරීක්ෂා කිරිම යන ක්‍රියාවලිය 2017 අගෝස්තු 08 දින සම්පූර්ණ කර ඇතත් රු. 25,832,600 ක වටිනාකමකින් යුත් සවිකිරිම් තොග ලේඛනවලට ඇතුළත් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 752/2 අනුව පවත්වා ගෙන යන ලෙස අදාළ අංශ ප්‍රධානීන් හා ස්ථානභාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | වත්කම් නිවැරදිව ගිණුම් ගතකල යුතු වීම සහ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 3.5 වත්කම් කළමනාකරණය - වාහන උපයෝජනය

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් වෑන් රථයක් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය වෙත 2019 ජනවාරි 21 දින තාවකාලිකව මුදාහැර තිබුණද 2021 ජූලි 05 දින වන විටද දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට හෝ තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පවරා දීමට අදාළ ආකෘති පත්‍ර අමාත්‍යාංශය වෙත යවා ඇත. වාහනය කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඇති බැවින් රථයේ ලියාපදිංචි සහතිකය ලබා ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | වත්කම් කළමනාකරණය විධිමත් පරිදි සිදු කළ යුතු වීම. |

## 3.6 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදි භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද සහ රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද තනතුරු 08 ක නිලධාරින් ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මේ වන විට ඇපතැන්පත් නොකල නිලධාරින් වෙත ඇපතැන්පත් කිරීම සඳහා දැනුම් දී ඇති අතර ඉදිරියේදී එම කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **දෙපාර්තමේන්තුවට අයත් ගාල්ල දඩල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නඩත්තු හා පාලන කටයුතු** | | |
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ඉදිකරනු ලැබූ ගාල්ල දඩල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 370.699 ක් වූ අතර 2021 මාර්තු 31 දිනට මුළු පිරිවැය රු.මිලියන 293.828 ක් විය. මෙම ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන සහ නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය සමග ව්‍යාපාර අවබෝධතා ගිවිසුමකට එළඹීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කිරීමට ප්‍රථම ඉදිකරන ලද ක්‍රීඩා පිටිය පිහිටි පරිශ්‍රයේ ඉඩම්වල අයිතිය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද මෙම අවබෝධතා ගිවිසුමකට එළඹීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එකඟතාවයක් ලබා ගැනීමට හෝ අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන හා නඩත්තු කටයුතු සිදුකිරීම ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය වෙත භාරදීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021.08.12 දිනැතිව ලිපියක් යොමුකර ඇත. ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදු කරමින් පවතී. | අවබෝධතා ගිවිසුමකට එළඹීමට ප්‍රථම ව්‍යාපෘතිය ඉදිකළ භූමියේ නෛතික භාවය පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ කළමනාකරණය පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු මගින් ඉටුකිරීම සඳහා මෙම ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීමේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාදී ඇතත් එයට පටහැනිව මෙම ක්‍රීඩා සංකීර්ණය නඩත්තු හා පාලන කටයුතු 2020 සැප්තැම්බර් 06 දින සිට 2050 | මෙ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සටහන් කරගන්නා ලදී | අමාත්‍ය මණ්ඩල තීරණවලට සහ නෛතික විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් 25 දක්වා වසර 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය වෙත ලබාදීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ප්‍රධාන ලේකම් සමග 2020 සැප්තැම්බර් 26 දින ව්‍යාපාර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මෙම අවබෝධතා ගිවිසුම නීතිඥවරයෙකු විසින් සහතික කර නොතිබුණු අතර, ගිවිසුමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වන නෛතික වලංගුභාවය පිළිබඳව තහවුරු කිරීමක් සිදුකරවාගෙන නොමැති බවද නිරීක්ෂණය විය. | | |
| **(ඇ)** | ගිවිසුමේ 13 ඡේදය පරිදි මෙම ක්‍රීඩාංගනයේ ගොඩනැගිලි පරිශ්‍රය ක්‍රීඩා කටයුතු සඳහා ලබාදීමේදී ඒ සඳහා අදාළ වන කාර්යය පටිපාටිය වාර්ෂිකව ඉදිරිපත් කර නොතිබුණු අතර, වෙන් කිරීම්, මුදල් ගෙවීම් හා ගිණුමේ ආදායම් සහ වියදම් පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් පාලක මණ්ඩලය විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය | අවබෝධතා ගිවිසුම පරිදි මසකට වරක් මුදල් ගෙවීම් හා ගිණුමේ ආදායම් සහ වියදම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් පාලක මණ්ඩලය විසින් ඉදිරිපත් කළ යුතු බවට සඳහන්ව ඇත. මේ පිළිබඳ පාලක මණ්ඩලයට සිහිකැඳවීමක් සිදුකර අදාල වාර්තා ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | එකඟ වූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම සහ විධිමත් කළමනාකරණයක් සිදු කිරීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කර තිබුණු තිරසර සංවර්ධන අරමුණු 03 ක් සඳහා ඉලක්ක 06 ක් ස්ථාපිත කර තිබුණු අතර එම ඉලක්ක සඳහා ජයග්‍රහන දර්ශක 06 ක් හඳුනාගෙන තිබුණි. 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු කරා | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රීඩා තරඟාවලි නොපැවැත්වීම හේතුවෙන් ප්‍රගතියන් ලබා ගත නොහැකි විය | තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමට අවශ්‍ය ප්‍රගතිය ලබා කර ගැනීම සඳහා අවශ්‍ය නියමිත ඉලක්කයන් සපුරා |

| | | |
|---|---|---|
| ළඟාවීමේ ඉලක්කයක් වූ 2028 වර්ෂය වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පරිසාධන මට්ටම කරා ළඟාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම සඳහා වූ ජයග්‍රහණ දර්ශකය වූ හඳුනාගත් ක්‍රීඩා තරඟාවලීන්හිදී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන අත්කර ගැනීමේ ප්‍රගතිය සියයට 5 ක් පමණක් බව නිරීක්ෂණය විය. එයට අමතරව ඉතිරි ඉලක්කයන් පහ වෙනුවෙන් දක්වා තිබූ ජයග්‍රහන දර්ශකයන් 05 ක් සඳහා කිසිඳු ප්‍රගතියක් අත්කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | | ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් ද තෘතිය මට්ටමේ පුරප්පාඩු 09 ක්ද, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 78 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 24 ක්ද පැවතුණු අතර එය තුළ ඇතුළත් දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්ය සාධනය සඳහා බෙහෙවින් බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් සහ ක්‍රීඩා කටයුතු සම්බන්ධ කාර්ය මණ්ඩලයේ තනතුරු 8 කට අදාළ පුරප්පාඩු 56 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධ මූලික කටයුතු සිදුකර ඇති අතර බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවති. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන හිඟ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු වීම. |